# අධ්‍යාපනය යනු
## ළමයින්ගේ විභවතා හඳුනා ගැනීමයි





''පුත්තා වත්ථු මනුස්සනං'' යනුවෙන් බුදුන් වහන්සේ දේශනා කර ඇත්තේ මනුෂ්‍යයින්ට දරුවන් වස්තුවක් බව පැහැදිලි කිරීමට බව මහා මංගල සූත්‍රයේ කියවෙන ''පුත්ත ධාරස්ස සංගහො'' අඹු දරුවන්ට සංග්‍රහ කිරීම යන තේරුමෙන් අර්ථ නිරූපණය වේ. ''රටක ඉරණම විසඳෙන්නේ පංති කාරමයෙන් බව'' පණ්ඩිත් ආචාර්ය විනෝබාබාවේ ප්‍රකාශ කර ඇත.

එමනිසා ''ආරෝග්‍යා පරමා ලාභා'' යන ධම්මපදයේ සඳහන් බුදු වදන අනුව ග්‍රීක දාර්ශනිකයන් "Sen Sane in Corparei Sano" නිරෝගී මනසක් ඇතිවීමට නිරෝගී සිරුරක්ද නිරෝගී සිරුරක් ඇති වීමට නිරෝගී මනසක්ද ඇතිවය යුතුයි යන්න විශ්වාස කරන ලදී. ඉහත සඳහන් ලතින් කියමනෙන් බිඳී ආ ඉංග්‍රීසි බසෙහිද "Helthy Body in Helthy Mind, යන එම ආර්ථයම ළමා අධ්‍යාපනය සඳහා උපයෝගී කරගෙන ඇත.



සුනිල් අබේසේකර
ආදි විද්‍යාර්ථී
කැළණිය විශ්ව විද්‍යාලය
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
(විශ්‍රාමික)

අද යුනෙස්කෝව මගින් ප්‍රකාශිත අධ්‍යාපන අරමුණ වන්නේ අධ්‍යාපනය තුලින් ලෝකයට ගැලපෙන ජාත්‍යන්තර මානවයෙකු තැනීමයි. ළමයෙක් වයස අවුරුදු තුන අවසන් වන විට තමා උපතින් ගෙන එන විභව ශක්තීන් අනුව ඔහුගේ මූලික අනාගත අරමුණු බොහෝ දුරට තීරණය කර අවසන් බව අධ්‍යාපන මනෝ විද්‍යාඥයින්ගේ මතයයි. ළදරුවා තම මවගේ කුසෙහි සිටින කාලයේදී පවා යම් ශබ්ද හඳුනා ගන්නා බවත් ඒවාට ප්‍රතිචාර දක්වන බවත්, එම කාලය තුළ දෙමව්පියන් ඉතා සහනශීලී මානසික තත්වයකින් සිටිය යුතු බව වෛද්‍ය විදුන්ගේ මතයයි.

මූලාරම්භයේදී ළදරුවාගේ මනස අති පිරිසිදු සුදු කඩදාසියකට උපමා කළ හැක. ක්‍රමයෙන් ඊට හොඳ හා නරක, හෝ සංකල්ප පස ඉඳුරන් මගින් සටහන් වීමට ආරම්භ වේ. මෙම ළදරු මනස ධන ආකල්ප වලින්පිරමී දෙමව් පියන්, නෑදෑ හිතවතුන්, ගුරු භවතුන් හා සමාජයේ පූර්ණ වගකීමයි. ඒ සඳහා නිවස, පංසල, කෝවිල, පල්ලිය ශුද්ධ භූමි විය යුතුය. බුදුන්වහන්සේ දේශනා කළ පරිදි ''උතුම්ම දානය ධර්ම දානය'' එම ආයතන තුලින් නිරතුරුව ලැබිය බුතුය. ඒ සඳහා 1. සිහි බුද්ධිය 2. ආචාරශීලී බව 3. විනය සඳහා මූලිකත්වය දිය යුතුය. අධ්‍යාපනය යනු හැදිච්චකමයි. ශික්ෂණයයි. හීලෑ කමයි. චරිතවත් බවයි. වැරදි නිවැරදි කර ගැනීමයි. උක්ත ලක්ෂණ වලින් තොර මනුෂ්‍යයා නිර්වස්ත්‍ර ව තිරිසනෙකුටත් වඩා අන්තය. ළමුන්ට වඩා ආදර්ශ විය යුත්තේ වැඩිහිටියන්ය.

අද පැවතිය යුත්තේ ප්‍රවීණතා ඉගෙනුම් සංකල්පයයි. එනම් ළමයාගේ දක්ෂතා විභවතා මට්ටම් හඳුනාගෙන ඊට අනුරූපීම සාධනය කරා ලඟා කරවීමයි. නමුත් අද ලංකාවේ පංතිකාමරයකට කොටු කර ගන්නා ළමුන්ගෙන් වැඩි දෙනෙකුට 6 ශ්‍රේණියට පසු ලැබෙන්නේ සමූහතා අධ්‍යාපනයකි. ලංකාවේ පවත්වන සෑම විභාගයකින්ම 50% වඩා අසමත් වීම නොගැලපෙන අධ්‍යාපන ක්‍රමයකට හොඳම නිදසුනයි.

අද ලංකාවේ උපකාරක පංති ව්‍යාධියක් බවට පත්ව ඇත. ඉන් ළමයින් ලබන මානසික පීඩනයෙන් මනසේ ඇති වන විකෘතිතා නිසා ඔවුන් වැඩිහිටයන් වූ විට අපචාරී ක්‍රියා වලට නැඹුරු වීමේ සම්භාවිතාව වැඩි වී තිබේ. උපතින් ලබන දක්ෂතා නොතකා වෛද්‍යවරු වූ සියල්ලෝම පාහේ බන්දි ගානේ බෙහෙත් කඩ දමාගෙන දුප්තුන්ගෙන් මුදල් ගරාගෙන තමන්ම මෙන්ම තමන් හදා වඩා ගත් දෙමව්පියන්ටත් පව් වුරවති. ලංකාවේ අද තිබෙන ලොකුම ප්‍රශ්ණය උගතුන්ගේ නූගත් කමයි. දුර්වල විභාග ක්‍රමයකින් උගතුණ් තෝරාගන්නා එකම රට ලංකාව විය හැක. ටයිපොලු වලින් ගෙල සිරකරගෙන සිටින රටේ උසස් නිලධාරීන්ගෙන් රටට වන සේවය අල්පය. රට මෙහෙයවන මහජන නියෝජිතයන්ගෙන් 90% කම් නූගතුන් බව පුවත්පත් වල වාර්තා විය. ජනාධිපතිතුමා පවා අද පවතින අසාධාරණ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන ලෙස ඉල්ලා ඇත. නමුත් නිදහස් අධ්‍යාපනයේ පියා වන සී.ඩබ්.ඩබ්. කන්නංගර වැනි වියතෙක් විශ්ව විද්‍යාල පද්ධතියෙන් බිහි නොවීම එය කල් ඇරීමට හේතු වී ඇත. කවදා හෝ සාර්ථක හා අවංක අඛණ්ඩ අධ්‍යාපන ක්‍රමයක් ඇරඹූ දිනක මෙම අධ්‍යාපනික සියළු රෝග නිට්ටාවටම සුවවනු ඇත.


**IMMIGRATION LAW @**
Australian Immigration Law firm
of the Sri Lankan Community

We are proud to have lead the way
for others to follow...

**Professional Immigration Legal Services**
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced
Lawyers & Registered Migration Agents



**Susantha Katugampala**
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



*We Deliver Results...*